**කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරනු ලබන විධාන 2018 අංක 06** 2018 අගෝස්තු 24

## මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබාදීමේදී වටිනාකම් මත ණය අනුපාත විධානය සංශෝධනය කිරීම

**2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 34 වන වගන්තිය යටතේ නිකුත් කරන ලදී.**

කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරන ලද 2018 අංක 05 දරන මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේදී වටිනාකම් මත ණය අනුපාත විධාන පහත දැක්වෙන විධාන මගින් ප්‍රතිස්ථාපනය කර සංශෝධනය කෙරේ.

3. වටිනාකම් මත ණය අනුපාතයෙන් නිදහස් කිරීම

3.1 ඉහත විධාන 2 හි දැක්වෙන සීමාවන් පහත දැක්වෙන ණය පහසුකම් සඳහා අදාල නොවේ.

(i) පළමු ලියාපදිංචි කිරීමේ දින සිට වසරක් ඇතුලත කිසිදු පුද්ගලයෙකුට හෝ ආයතනයකට පැවරීම සිදු නොකිරීමේ කොන්දේසියට යටත්ව තම මූලික ව්‍යාපාර කටයුතු සඳහා උපයෝගී කර ගැනීමට වාහන සංචිත මිලදී ගන්නා සංචාරක සහ / හෝ ප්‍රවාහන කටයුතුවල නිරත සමාගමකට ප්‍රදානය කරනු ලබන ණය පහසුකම් :

(ii) මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් නියම කරන ලද කල්බදු මූල්‍ය ක්‍රමය යටතේ වාහන ප්‍රසම්පාදනය කිරීම සඳහා රජයේ නියෝජිත ආයතන වෙත ලබාදෙන ණය පහසුකම්; සහ

(iii) රජය මගින් ලබා දීමට යෝජිත සහනදායි කල්බදු මූල්‍ය පහසුකම යටතේ රාජ්‍ය සේවයේ නියුතු ක්ෂේත්‍ර නිලධාරීන්ට සහ දුෂ්කර ප්‍රදේශවල සේවයේ නියුතු ගුරුවරුන්ට යතුරු පැදි මිලදී ගැනීමට ප්‍රදානය කරනු ලබන ණය පහසුකම්.

3.2 මෙවැනි ණය පහසුකම් ලබාදීමේදී විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් අභ්‍යන්තර සීමාවන් පවත්වා ගත යුතු අතර ප්‍රමාණවත් අවදානම් කළමනාකරණ ක්‍රමවේදයන් අනුගමනය කල යුතුය.

ඩබ්. රණවීර
**අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය**
**ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**